**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පාසල-2020 මාර්තු/අප්‍රේල්**

**ඉතිහාසය**

**07ශ්‍රේණිය__ප්‍රශ්නපත්‍ර 02**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

අංක 1 සිට 5 දක්වා වරහන් තුළ ඇති නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

1. ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය .................................. ලෙස සැලකේ.
2. වී වගාවේ ප්‍රධාන කන්න දෙක ............................................ලෙස හඳුන්වයි.
3. ..............................................ලෙස හඳුන්වන ලද්දේ රත්‍රං ආශ්‍රිත ශිල්පීන්ය.
4. පොලොන්නරුව රාජධානියේ ................................................ පිහිටුවා ඇත.
5. දෙවන පරාක්‍රම බාහු රජු රජකම් කලේ ........................ රාජධානි සමයේ දීය.

(යල මහ/පරාක්‍රම සමුද්‍රය/දඹදෙණිය/ස්වර්ණ කාරක/හේන්ගොවිතැන)

ප්‍රශ්ණ අංක 6-10 දක්වා ප්‍රශ්ණ වල ඇතුළත් වගන්තිවලින් නිවැරදි අදහස් ඉදිරිපත් වේ නම් (√) ලකුණද වැරදි අදහසක් නම් (x) ලකුණද වරහන් තුළ යොදන්න.

6. රජුගේ හමුදාව ඇත්, අස්, රිය, පාබල යන චතුරංගනී සේනාවෙන් සමන්විත විය. ( )
7. අතීතයේ ගව දෙන හඳුන්වා ඇත්තේ “කිරි ගෙරි“ ලෙසය. ( )
8. සාලිය කුමරුගේ බිසව වු රජ්ජුමාලා රසවත් ලෙස ආහාර පිළියෙල කළ බව සද්ධර්මාලංකාරයේ සඳහන්වේ . ( )
9. නිශ්ශංක මල්ල රජු ඉන්දියාවේ කාලිංග දේශයේ සිටි සද්ධාතිස්ස රජුගේ පුතාය. ( )
10. ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව හැදින්වුයේ තැප්‍රොබේන් නමිනි ( )

ප්‍රශ්ණ අංක 11-15 දක්වා ප්‍රශ්ණ වල (අ) කොටසට ගැළපෙන හෝ එයට සම්බන්ධයක් ඇති (ආ) කොටස තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය එහි ඇති තිත් ඉරි මත ලියන්න.

| අ - කොටස | ආ - කොටස |
|---|---|
| 11. කොට්ටේ රාජධානිය තැනීම ( ) | A. හාතිකාභය |
| 12. ග්‍රීසිය අල්ලාගෙන එහි රජ වීම ( ) | B. සංඛ |
| 13. රුවන්වැලි සෑය සැරසවීමට පබළු ගෙන්වූ රජු ( ) | C. නිශ්ශංක අල කේශ්වර |
| 14. මිණිපේ ගංදෙණිය පර්වතයේ බල කොටුවක් පිහිටුවා ගත්තේ ( ) | D. පළමුවන සේන |
| 15. මානවම්ම රජ පෙළපතට අයත් රජ කෙනෙකි ( ) | E. ඇලෙක්සැන්ඩර් |

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

16-20 දක්වා ප්‍රශ්ණ වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

16. නිශ්ශංක ලතා මණ්ඩපය පිහිටා ඇති රාජධානිය වන්නේ

1.අනුරාධපුර 2. පොළොන්නරුව 3.දඹදෙණිය 4. මහනුවර

17. එකල පරාක්‍රම පුරය වර්තමානයේ හඳුන්වන්නේ

1.අළුත් නුවර 2. අනුරාධපුරය 3. මාගම් පුර 4. පඬුවස් නුවර

18. සිගිරි නිර්මාණ ලෝක උරුමයන් ලෙස ලැයිස්තුවට ඇතුලත් කළ වර්ෂය වන්නේ.

1. 1988 2. 1991 3. 1982 4. 1992

19. ලාක්ෂා චිත්‍ර කලාවට ප්‍රසිද්ධ ප්‍රෙද්ශය වන්නේ.

1.සබරගමු ප්‍රදේශය 2.දුම්බර ප්‍රදේශය 3. මහනුවර ප්‍රදේශය

4. අම්බලන්ගොඩ ප්‍රදේශය

20. ඔලිම්පස් කන්ද පිහිටි රට වන්නේ

1. ඉතාලිය 2. තුර්කිය 3.මැසිඩොනියාව 4. ග්‍රීසිය

2 - කොටස

දී ඇති ප්‍රශ්ණ අතුරින් ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

01. අනුරාධපුර රාජධානිය 1017 වර්ෂයේ බිඳ වැටුණි. අනතුරුව වසර 53ක් චෝල පාලනය පැවතුනි. ලාංකික අභිමානය ගොඩනගමින් නැවත පොලොන්නරුව රාජධානිය කරවීමට රජවරුන්ට හැකි විය.

1. පොළොන්නරු රාජධානියේ රජවරු 3ක් නම් කරන්න. ල.3

2. අ. පොලොන්නරු රාජධානියේ ප්‍රථම පාලකයා නම් කරන්න.

ආ. එම රජුගෙන් සිදු වූ සේවාවන් දෙකක් සඳහන් කරන්න. ල.4

3. අ. මහා පරාක්‍රමබාහු රජුගේ උපන් ස්ථානයේ තැනූ චෛත්‍ය කුමක්ද? ල.2

ආ. මහා පරාක්‍රමබාහු රජුගේන් සිදුවූ ආගමික, ආර්ථික හා විදේශ ප්‍රතිපත්ති එක බැගින් ලියා දක්වන්න. ල.3

02. අතීතයේ දී අප රටේ ජනතාව ජීවත් වීම සඳහා විවිධ වෘත්තීන් වල නිරත වූහ.

1. අතීතයේ මෙරට වාසය කළ ජනතාවගේ ජීවන රටාවට ඇතුළත් වූ අංග 3 නම් කරන්න ල.3

2. පහත සඳහන් උපකාරක යොදාගන්නේ කුමන කර්මාන්ත සඳහාද?

1. මයින හම
2. සක පෝරුව ල.4

3. අ.මෙම නිෂ්පාදනයන් නිර්මාණය කළ ශිල්පීන් නම් කරන්න.

1. රෙදි පිළි-
2. මැණික් කැපීම, ඔප දැමීම. ල.2

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

ආ. පහත දැක්වෙන සංස්කෘත ලක්ෂණ එකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වා දෙන්න.

1. අත්තම් ක්‍රමය -
2. විවාහය -
3. අවමංගල්‍ය - ල.3

03.රට තුළ යහපත් පාලනයක් ගෙන යාමට අනුරාධපුර යුගයේදී රජතුමාට නිරන්තරයෙන් සේනාපති හමුදාව හා ප්‍රාදේශීය අධිපතිවරු සහය දැක්වූහ.

1. රටේ ආරක්ෂාව සඳහා සිටි චතුරංගනී සේනාව නම් කරන්න. ල.3

2. අ .එකළ ශිලා ලේඛන වල සඳහන් කර තිබූ නීති වර්ග 2ක් ලියා දක්වන්න. ල.2

ආ. දසගම් පාලනය හා රාජකීය දීමනා පිළිබඳව සඳහන් ශිලා ලිපි නම් කරන්න. ල.2

3. අ. අනුරාධපුර යුගයේ රජවරු පමණක් ශුභ සිද්ධියට විශේෂ උනන්දුවක් දැක්වූ රජවරු දෙදෙනෙකු නම් කරන්න. ල.2

ආ. එම රජවරුන්ගෙන් ඉටු වූ සමාජ ශුභ සිද්ධිය කෙටියෙන් දක්වන්න. ල.3

04. ශ්‍රී ලාංකික සංස්කෘතියේ අභිමානය ලොවට පෙන්වීමට අතීත මුතුන් මිත්තන්ගේ නිර්මාණ 6ක් ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

1. ශ්‍රී ලංකාවේ ලෝක උරුම 3ක් නම් කරන්න ල.3

2.



අ. මෙම රූපයෙන් දැක්වෙන ස්ථානය නම් කරන්න. ල.2

ආ. මෙම ස්ථානය ප්‍රයෝජනයට ගත් යුරෝපා ජාතිකයින් වර්ග 2 නම් කරන්න. ල.2

1....................................... 2.......................................

DEPARTMENT OF EDUCATION

3. අ. කැටපත් පවුරේ සඳහන් කර ඇත්තේ මොනවාද? ල.1

ආ. සීගිරි බලකොටුව නිර්මාණය කළ රජතුමා නම් කර එම නිර්මාණය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. ල.4

05. පරම්පරාවෙන් පරම්පරාවට ඒ ඒ ජන කණ්ඩායම් විසින් රැගෙන එන සංස්කෘතික උරුමය අස්පෘශ්‍ය උරුම ලෙස හඳුන්වයි.

1. අස්පෘශ්‍ය උරුම යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ල.3

2. අ. මේ සාම්ප්‍රදායික කලා සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ මොනවාද

- පැදුරු විවීම -
- රුකඩ කලාව -
- වෙස් මුහුණු -
- පිත්තල කැටයම් කලාව - ල.4

3. අ. ලාක්ෂා කර්මාන්තයෙන් අලංකාර කරන භාණ්ඩ නම් කරන්න. ලාක්ෂා ලබා ගන්නා ශාකය නම් කරන්න. ල.2

ආ. අපේ සංස්කෘතික උරුම රැක ගැනීමේ වටිනාකම කෙටියෙන් විස්තර කරන්න. ල.3

06. 1215 වර්ෂයේ කාලිංග මාඝයේ ආක්‍රමණයෙන් පොලොන්නරු රාජධානිය බිඳ වැටුණි. විවිධ ආරක්ෂිත ස්ථානවල බල කොටු තනාගෙන සිටි නායකයින් කිහිප දෙනෙකු විය.

1.සංඛ සෙනවි, සුභ සෙනවි, බුවනෙකබාහු, ආදිපාද තුමා බල කොටු පිහිටුවා ගත් ස්ථාන නම් කරන්න.

2. අ.රාජධානි නිරිත දෙසට සංක්‍රමනය වීමත් සමග ආර්ථික රටාවේ වෙනස්කම් 2ක් සඳහන් කරන්න.

ආ. දඹදෙණි රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රජතුමා සිදු කළ සටන් තුන සඳහන් කරන්න. ල.3

3. අ. දෙවන පරාක්‍රමබාහු රජුට හිමි වූ උපාධි නාමය කුමක්ද? ඔහු රචනා කළ කෘතිය කුමක්ද? ල.2

ආ. හයවන පරාක්‍රමබාහු රජු රටක් එක්සේසත් කිරීමට ගත් ගත් පියවර දෙකක් සඳහන් කරන්න.

07. ග්‍රීක, රෝම, ශිෂ්ටාචාර මගින් නූතන යුරෝපා ශිෂ්ටාචාර පෝෂණය වී ඇත.

1. ග්‍රීසිය හා ඉතාලිය පිහිටි මුහුද හා ඉතාලියේ අග නුවර ද නම් කරන්න. ල.3

2. අ. පෙර රාජ්‍ය වල කැපී පෙනෙන ලක්ෂණ 2ක් දක්වන්න. ල.2

ආ. ග්‍රීසියේ ක්‍රීඩා වර්ග 2ක් නම් කරන්න. ල.2

3. අ. රෝම අධිරාජ්‍ය අයත් වූ ප්‍රදේශ මොනවාද? ල.2

ආ. රෝමය සමග වෙළඳ සම්බන්ධතාව පැවැත් වූ රටවල් 2ක් නම් කර අප රට සමග අතීතයේ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION